# මුදල් සොයා සවුදියට ගොස් ඇණ ගැසුම් කෑ කාන්තාවක්



**මා**තර, තිහගොඩ, බටුවිට, උඩදෙනිය පදිංචි එල්. පී. ආරියවතී නමැති තිදරු මව (49) එම ගමේ සාමාන්‍ය ගෘහණියකි. ඇයත්, සැමියාවන ඩේවිඩ් සහ දියණියන් දෙදෙනාත්, පුතාත් ඇතුළු පවුලට ස්ථිර ආදායමක් හෝ හොඳ නිවසක් නොවීය. ඔවුන් ජීවත්වූයේ කටු මැටියෙන් සාදාගත් නිවසකය. පිටරට රැකියාවකට ගොස් කිසියම් මුදලක් උපයාගෙන විත් ගෙය හොඳට හදාගත යුතුයයි ඇය සිතුවාය. ඒ අනුව ආරියවතී කොළඹ රැකියා ඒජන්සියකට මුදලක් ගෙවා විදේශ රැකියාවකට යාමට අවශ්‍ය කටයුතු සූදානම් කරගත්තාය.

ඇයගේ මෙම ගමනට සැමියාද, දරුවන්ද විරුද්ධ වූ නමුත් පිටරට ගොස් ආවොත් කිසියම් මුදලක් හම්බ කරගෙන විත් පිළිවෙළකට ජීවත්වීමට හා ගෙය හොඳින් සාදා ගැන්මට මගක් පෑදෙන බව සිතා ඒ ගමන යාමට ස්ථිර වශයෙන්ම ඇය සිතට ගත්තාය. ඒ අනුව ආරියවතී මෙම 2010 මාර්තු මාසයේ 25 වෙනි දින සවුදි අරාබියාවේ ගෘහ සේවිකාවක් ලෙස රැකියාවකට ගියා ය.

ඇයට සවුදියේ රැකියාව ලැබුණේ කාපට් බිස්නස් කරන අරාබිකාරයෙකුගේ තෙමහල් නිවසකය. එය ඉතා අලංකාර වූ බැවින් ඇය සිතුවේ තමා සුරපුරයකට ආ ලෙසකි. එම ව්‍යාපාරිකයා, බිරිඳ හා දරුවන් හත්දෙනෙක්ද එම නිවසේ විසූහ. ඉන් දරුවන් තිදෙනෙකු පාසැල් ළමයින් වූ අතර, ලොකු පුතා පොලීසියේ නිළධාරියෙකු බව පෙනුණේ ඔහු දිනපතා පොලිස් යුනිපෙ-ෆ්ම් ඇඳ නිවසෙන් පිටව යන බැවිනි.

ආරියවතීට පැවරුණේ ඒ ගෙය සුද්ධකරන්නටය. පොළව මදින්නටය. මුල් කාලයේ ඇයට කිසිම කරදරයක් වන බවක ඉඟියක්වත් දැනුණේ නැත. එහෙත් ක්‍රමයෙන් ඒ ගෙදර හැම කෙනෙකුගේම ආඥාවන්ට මුහුණ දෙන්නට ඇයට සිදුවිය. කිසිදු විවේකය-නැතිව එක දිගටම උදේ සිට මහ රෑ වනතුරු ඇයට ගෙදර වැඩපළවල යෙදුනාය. මුලින් බැණුම් පමණක් වූ නමුත් ක්‍රමයෙන් ඇයට අතින් හෝ පොලු කැල්ලකින් පහරදෙන තත්වයට හැරුණේය.

තවත් ප්‍රශ්නයක් වූයේ ආරියවතී දැන සිටියේ තනිකරම සිංහළ පමණක් වීමය. ගෙදර අය කියන කිසිවක් ඇයට තේරුණේ නැත. බොහෝ විට ඇයට ශිත කරණයෙන් යමක් ගෙනැවිත් දෙන්නටයයි කෑම කන අතරේ ස්වාමිදුව කීවිට ඒ කියූ දෙය නොතේරුණ බැවින් ආරියවතී ගෙන ගොස් දුන්නේ අනවශ්‍ය වෙනත් දෙයකි. මෙය ගෙදර අයගේ දැඩි කෝපයට හේතුවිය. මේ සියල්ලේ කෙළවර වූයේ ඇයට ගෙදර සියළු දෙනාම අතට අහුවුණු දෙයින් පහරදීමෙනි.

අන්තිමට ව්‍යාපාරිකයා යකඩ ඇණ ගිනියම් කොට මිටියකින් ඒවා ආරියවතීගේ අතට, යටි පතුල් වලට හා කකුලට ගැසුවේ ය. මෙසේ කරද්දී නොසෙල් වෙන්නට ආරියවතී තරයේ අල්ලාගෙන සිටියේ ගෙහිමි කාන්තාවය. සතියකට වරක් මෙම ඇණ ගැසීම සිදුවූ බව කියති. ඇය මරහඬ දී කෑ ගැසුවත් පිහිටට කිසි-වෙකු ආවේ නැත. එසේ කෑගසද්දී ඒ ගෙදර දරුවන් පිහියක් ගෙනැ විත් ඇයගේ බෙල්ලට තබා කෑගැහුවොත් බෙල්ල කපන බවට තර්ජනය කර ඇත. මේසා දරුණු වධ වේදනා විඳිමින්ම ඇයට ගෙදර වැඩපළ කරන්නටද සිදුවිය. යටිපතුල් ඉදිමී ලේ සහ සැරව ගලන තත්වයක් ඇතිවුනත් ඇයට බෙහෙත් කිසිවක් ලැබුණේ නැත. ලංකාවේ ගෙදර අයට පණිවුඩයක් යවන්නට හෝ ටෙලි පෝන් පණිවුඩයක් දෙන්නටද විදියක් නොවීය.

අන්තිමේදී අසාධ්‍ය තත්වයට පත්වූ පසු අරාබි පවුල ආරියවතී රැගෙන ගොස් ඒ නගරයේ ඒජන්සිකාරයාට බාර කළෝය. ඇයට පඩි ගෙවා තිබුණේද ඉතා අඩුවෙනි. කෙසේ හෝ ඒජන්සිය ආරියවතී පසුගිය මාසයේ අගෝස්තු 25 දින ආපසු ලංකාවට එවුවේය. ඇය තමාට වූ ඛේදවාචකය කිසිවෙකුට කීවේ නැත. වේදනාව උසුලා ගෙන ගමට ගියාය. එහිදී ඇය දුටුවේ ඔවුන් ජීවත් වූ නිවස ඇය නැති පසුගිය කාලයේ බිමටම කඩා වැටී ඇති බවය. නිවසක් තනන්නට මුදල් ගෙනෙන්ට ගිය සිහිනය සම්පූර්ණයෙන්ම විනාශවූයේය.

ගෙදරදී ඇය එන්න එන්නම දුර්වල වූවාය. අඩිය බිම ගහන්නට නොහැකි තත්වයක් උදාවිය. එහෙත් දරුවන්ට වත් සැමියාටවත් ඇය විඳි වධවේදනා අතවර ගැන කිසිවක් නොකීවාය. කැක්කුම වැඩි වී ඇයගේ දරුවන් විසින් ඇයව ගමේ දොස්තර මහතෙක් ළඟට ගෙන යන ලද කල්හි ඇය සිදුව ඇති සියළු කතාව වෛද්‍යවරයාට පැවසුවාය. ඔහු කඩිනමින් ඇය කඹුරුපිටියේ මූලික රෝහලට යැව්වේය. එහිදී වෛද්‍යවරු එක්ස්රේ කර ආරියවතීගේ ශරීරය තුළ වූ අඟල් දෙකේ දෙකහමාරේ යකඩ ඇණ සහ ඉදි කටු 24 ක් ශල්‍යකර්ම මගින් ඉවත් කළෝය.

♦ කීර්ති

# සමුගත් නීතිවේදී හිතවතා ගුණදාස මාබරණ



**අ**ප හිතවත් ගුණදාස මාබරණයන්ගේ මරණය ගැන අසා මා ද මා බිරිඳ පද්මිණී ද ඉතා කම්පාවට පත්වීමු. ඔහු සිය මවගේ මරණය වෙනුවෙන් ලන්ඩනයේ සිට ශ්‍රීලංකාවට, වීරකැටිය ගමට ගොස් ඇත. එම අවමඟුල නිමවී දින දෙකකින් රෝගාතුර වූ ඔහු හෘදයාබාධයකින් මියගොස් තිබේ.

ගුණදාස මාබරණයන් කළ නිහඬ සේවාව කාටත් තේරුම් ගියේ ඔහුගේ මරණයෙන් පසුවයයි කීවොත් නිවරදය. තිස් වසරක් මුළුල්ලේ පැවති කොටි ත්‍රස්තවාදයත්, එල්ටීටීඊ ආධාරකරුවන් ලන්ඩනය ඇතුළු යුරෝපීය රටවල ගෙන ගිය ශ්‍රීලංකා විරෝධී ප්‍රචාරක කටයුතුවලදීත් ඊට එරෙහිව ප්‍රබල හඬක් ඇතිකරන්නට ශ්‍රීලාංකිකයින් ලන්ඩනය තුළ ඒකරාශි කරන්නට මාබරණ ගත් වෙහෙස සහ කැපවීම ඔහුගේ වියෝවත් සමගම මිතුරන් රැසකගේ කතාබහෙන් ඔවුන් තේරුම්ගෙන ඇතිබව මට වැටහිණ.

මාබරණ මට මුලින්ම හමුවුණේ **1974 -76** වර්ෂ තුළ කොළඹ ඇක්වයිනාස් විශ්වවිද්‍යාල පීඨයේ බාහිර ශිෂ්‍යයෙකු ලෙස නීති උපාධිය හැදෑරීමට පැමිණි අවස්ථාවේදීය. මාත් පද්මිණීත් සිටි තැනට පැමිණි ඔහු තමන් හඳුන්වා දෙමින් ඉතා ලෙන්ගතුව කළ ඒ පළමු කතාබහෙන්ම ඔහු අපේ මිතුරෙකු බවට පත්වීය.

දකුණු පළාතේ වීරකැටිය නම් ගමේ වැදගත් පවුලක උපත ලද මාබරණ මූලික අධ්‍යාපනයෙන් පසු බී. ඒ. උපාධිය ලබාගෙන කොළඹ නාරාහේන්පිට කම්කරු දෙපරේතමේන්තුවේ කම්කරු නිලධාරියෙකු වශයෙන් සේවය කළේය. හාම්පුතුන් සේවකයන් අතර වූ නඩු හබ විසඳීමේ දක්ෂයෙකුවූ ඔහු පසුව නීති විද්‍යාලයට ගොස් එහි ඉගෙනී මේ කටයුතු අවසන්කර **1979** දී නීතිඥවරයෙකු ලෙස දිව්රුම් දුන්නේය.

ඇක්වයිනාස් ආයතනයේ එකල උගත් සිසුන් විවිධ දේශපාලන කටයුතු වල නිරත වූහ. සමසමාජ පාක්ෂිකයෙකු වූ මාබරණද ඒ අත්හැර දමා එක්සත් ජාතික පක්ෂයට එක්වීය. එකල එහි සිටි සිසුන් අතර නැසී ගිය හර්ෂ අබේවර්ධන (එජාප මහ ලේකම්) ඔසී අබේගුණසේකර, හිටපු කෘෂිකර්ම ඇමති හේමකුමාර නානායක්කාර, හිටපු ජනමාධ්‍ය ඇමති ඉම්තියාස් බකීර් මාකර්, මිනුවන්ගොඩ හිටපු මන්ත්‍රී මොහාන් ගුණසේකර හා ආචාර්ය දයාන් ජයතිලක යන අය සඳහන් කළ හැකිය.

නීති විදුහලේද මාබරණ කඩිසර ක්‍රියාකාරී පුද්ගලයෙකු වීය. ඔහු නීති ශිෂ්‍යයින්ගේ එජාප සංගමයට බැඳී දේශපාලන කටයුතු වලට සහාය දුන්නේය. වරක් මුල්කිරිගල අසුනට නාමයෝජනා ඉල්ලා සිටි බවද මතකය. නිති විදුහලේ එකල ඔහුගේ සමකාලීන යන් ලෙස නැසීගිය හිටපු අධිකරණ ඇමති අමරසිරි දොඩංගොඩ, ඇමතිවරයෙකු වූ මහින්ද විජේසේකර, ධර්මදාස බණ්ඩා, නැසීගිය සන්ඩේ ලීඩර් කතුවර ලසන්ත වික්‍රමතුංග සහ වර්තමාන රූපවාහිනී සභාපති සරත් කෝන්ගහගේ ආදීන් සඳහන් කළ හැකිය.

**1980** මැද භාගයේදී ගුණදාස මාබරණ ලන්ඩනයට පැමිණියේ වැඩිදුර සිය අධ්‍යාපන කටයුතු කරගෙන යාමේ අදහස ඇතිවය. ඒ ආ යුගයේ සිටම ඔහු විවිධ ආකාරයෙන් දේශප්‍රේමී කටයුතු වල නිරත වූයේය. විශේෂයෙන් මා මුලින් සඳහන් කළ පරිදි ත්‍රස්තවාදීන් අප මව්බිමට එරෙහිව ගෙනගිය විෂම ප්‍රචාරයන්ට එරෙහිව ඔහු තනිවම ද, එක්සත් රාජධානියේ බොහෝ දේශප්‍රේමී ලාංකික සංගම් හා ආයාතනයන් සමග ද සහයෝගයෙන් කටයුතු කළේය. පැවති අනේක පෙළපාලි උද්ඝෝෂණයන්හි ඔහු ඒකාන්තයෙන්ම දකිනු හැකිවිය. ලන්ඩනයේ සියළුම පන්සල් විහාරස්ථාන සමග ඔහු සමීපවූයේය. බ්‍රිතාන්‍යයේ ලේබර්, කොන්සර්වේටිව් හා ලිබරල් ඩිමෝක්‍රැටික් දේශපාලන පක්ෂවල මන්ත්‍රීවරුන් නිතර හමුවෙමින් ශ්‍රීලංකාවේ ප්‍රශ්නයන් පිළිබඳව සැබෑ තත්වය පැහැදිලි කරමින් ත්‍රස්තවාදීන්ට උදව් නොකරන ලෙස ඔහු නිතර ඔවුන්ට ආයාචනා කළේය. අවශ්‍ය ලිපි ලේඛන සකසා ඒ වගකිව යුතු අයට යැවීය.

නීතිඥයෙකු ලෙස බටහිර ලන්ඩනයේ තමාගේම ආයතනයක් පිහිටවූ මාබරණ ලන්ඩනයට පැමිණි බොහෝ ලාංකික නීතිඥවරුන්ටද, නීතියේ පිළිසරණ පැතූ අප රටේ බොහෝ දෙනෙකුටද නීති ආධාර ලබාදී සහන සැළසූ බව එම නඩු රාශියකට ඔහු සමග පෙනී සිටි අධිනීතිඥ ප්‍රින්ස් ගුණසේකර මහතා පැවසූයේ මාබරණගෙන් වූ මෙහෙය සිහිපත් කරමිනි.

ලන්ඩනයේ වෙසෙන නීතිඥයින් අතර **2001** දි පමණ ප්‍රථම වරට ශ්‍රීලංකා නීතිඥවරුන්ගේ සංගමයක් ආරම්භකිරීමේ ගෞරවය ඔහුට හිමිවේ. ඒ නිසාම අද ලංකා නීතිඥවරුන් එකම වහළක් යට රැස්වීමේ වරම් ලැබී ඇත. මෙම සංගමයේ පසුකාලීන සභාපතිවරයා ලෙස රාජ නීතිඥ ශ්‍රීමත් ඩෙස්මන්ද සිල්වා වැනි ජ්‍යෙෂ්ඨ නීතිඥයින් පත්කරගන්නට ඔහු කටයුතු කළේය. එය මෙරට නීති සංගම් ඉතිහාසයේ වැදගත් කරුණකි.

මාබරණ මට අවසන් වරට හමුවූයේ පසුගිය වසරේ ජූනිමාසයේ දීය. ශ්‍රීලංකාවේ ත්‍රස්තවාදය අවසන් කර එහි විජයග්‍රහණය සැමරීම පිණිස වෙස්මිනිස්ටර් චතුරශ්‍රයේ තිබූ පෙළපාලියට ඔහු සුදු මිතුරු මිතුරියන් පිරිසක්ද සමග පැමිණ සිංහ කොඩි හා බැනර්ද අතැතිව මහ හඬ නගමින් බ්‍රිතාන්‍ය පාර්ලිමේන්තු චතුරශ්‍රය වටා ගිය මොහොත මට දැන් මෙන් මතකය. ය. ඊට පෙර මාස ගණනක් කොටි ත්‍රස්තවාදී ආධාරකරුවන් ලැගුම්ගෙන සිටි ඒ භූමිය පසුකර අප සැම ගමන් කළේ අප යුද්ධය ජයග්‍රහණය කළ බව ලොවට හඬනගා කියමිනි. මාබරණගේ උස් පැහැදිලි කටහඬ මට තවම ඇසෙනු වගේය.

මාබරණයන්ගේ අඩුලුහුඬුකම් තිබෙන්නට පුළුවන. එහෙත් ඔහු සිය මව්රට වෙනුවෙන් අවසන් මොහොත දක්වා අඛණ්ඩව, අවංකව කළ සේවය ප්‍රශංසනීයය. එවැනි සේවයක් කර ඇති අය මා දන්නා තරමින් සිටින්නේ කීප දෙනෙකු පමණි. ඒ ගෞරවය ඔහු අද නැතත් අප ඔහුට පිදිය යුතුය.

නීතිඥ ගුණදාස මාබරණ මහත්මාණන්ට උතුම්වූ නිවන් සුව පතමු !

♦ නීතිඥ ශාන්ත සේනාධීර
London N4


